**දකුණු පළාත් සභාව - 2017**
**-------------------------------**

දකුණු පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

(අ) පළාත් සභා අරමුදල් ගිණුම

------------------------------

සමාලෝචිත වර්ෂයේ දකුණු පළාත් සභා අරමුදල් ගිණුම 2018 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, එම ගිණුම නැවත සංශෝධනය කර 2018 අප්‍රේල් 19 දින ඉදිරිපත් කරන ලදි. 2018 ජුනි 06 දින කෙටුම්පත් විගණන වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු සංශෝධිත ගිණුම 2018 ජුනි 28 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) අනෙකුත් ගිණුම්

-----------------

2018 මැයි 31 දිනට අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 25 | 25 |
| (ii) | ආදායම් ගිණුම් | 28 | 28 |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 90 | 90 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 10 | 10 |
| (v) | අරමුදල් ගිණුම් | 07 | 07 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 05 |
| | එකතුව | 165 | 165 |

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් 04 ක පැවති රු.25,353,896 ක මාර්ගස්ථ මුදල් ශේෂයක් 2018 ජුනි 30 දින වන විටත් ලැබී නොතිබුණු බැවින් මෙම වටිනාකම මාර්ගස්ථ මුදල් නොවන බව නිරීක්ෂණය විය.

(ආ) විෂය අංක 31202 දරන කැකණදුර කුකුළු ගොවිපල පවත්වාගෙන යාම සහ බීජ රක්නාගාරයේ වාණිජ අත්තිකාරම් ගිණුමේ ශුද්ධ ලාභය රු.2,546,670 ක් විෂය අංක 31203 දරන කැකණදුර සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ වාණිජ අත්තිකාරම් ගිණුමේ ශුද්ධ ලාභය රු.292,175 ක් හා විෂය අංක 32048 දරන වක්වැල්ල කලමනාකරණ හා සංවර්ධන පුහුණු ආයතනයේ වාණිජ අත්තිකාරම් ගිණුමේ ශුද්ධ ලාභය රු.10,312,745 ක් වාණිජ අත්තිකාරම් ගිණුම්වල ලාභය මාරු කිරීමේ ආදායම් සංකේත අංක 2003-02-22 ට මාරු කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන ලේකම් කාර්යාලයේ මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වැය විෂයය යටතේ ප්‍රධාන අමාත්‍ය මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරුසේවා අමාත්‍යාංශය හරහා දකුණු පළාත් සංවර්ධන අධිකාරිය වෙත වියදම් කිරීම සඳහා ලබාදෙන ලද රු.18,650,000 ක මුදලින් 2017 දෙසැම්බර් 31 දිනට රු.15,650,000 ක මුදලක් ඉතිරිව තිබියදී සම්පූර්ණ මුදල වියදම් කල බවට ප්‍රධාන අමාත්‍යාංශය විසින් ප්‍රධාන ලේකම් කාර්යාලයට මාසික ගිණුම් සාරාංශ මඟින් වාර්තා කර තිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

-------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද පළාත් අරමුදල් ගිණුමේ දැක්වෙන එකතුව රු.2,192,646,151 ක් වූ ගිණුම් විෂයයන් 03 ක හා පළාත් පාලන ආයතනවල ගිණුම් 49 කට අදාළ ශේෂයන් හා ඒවා තහවුරු කෙරෙන උපයෝගී ලේඛන සහ වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පවතින බව අනාවරණය විය. විගණනයේදී නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.839,682,919 ක් විය.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------

දකුණු පළාත තුළ පිහිටි කලාප අධ්‍යාපන කාර්යාල 11 ට අදාළව අන්තර් කලාප ණයගැති හා ණයහිමි ශේෂ අතර රු.12,569,723 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

(i) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල ශේෂයවූ රු.1,235,649,214 ක් තුළ පහත විස්තර දැක්වෙන පරිදි නිලධාරීන් 824 දෙනෙකුගෙන් තවදුරටත් අය විය යුතු එකතුව රු.30,816,573 ක් වූ ණය ශේෂ ඇතුළත්ව තිබුණි.

| විස්තරය | නිලධාරීන් සංඛ්‍යාව | අය විය යුතු ණය ශේෂ |
|---|---|---|
| | | රු. |
| ස්ථාන මාරු වී ගිය | 552 | 21,372,914 |
| විශ්‍රාම ගිය හා මියගිය | 207 | 7,075,391 |
| වැඩ තහනම් කළ | 25 | 1,115,470 |
| සේවය හැර ගිය/ වැටුප් රහිත නිවාඩු | 40 | 1,252,798 |
| | 824 | 30,816,573 |

(ii) දකුණු පළාතේ ආයතන , වෙනත් පළාත් සභා හා මධ්‍යම රජයේ ආයතන වලින් ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 503 දෙනෙකු වෙනුවෙන් නිරවුල් කළයුතු ණය ශේෂවල එකතුව රු.20,535,308 ක් විය.

2.2.6 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය ix වැනි පරිච්ඡේදයේ 2.2 ඡේදය | 536,774 | වක්වැල්ල කළමනාකරණ හා සංවර්ධන පුහුණු ආයතනය විසින් සම්පත් දායකයන්ට ගෙවනු ලබන ගාස්තුවෙන් සියයට 10 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මෙම ආයතනයේ පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ සම්පත්දායකයන්ට ගෙවා තිබුණු රු.5,367,740 ක මුදලින් සියයට 10 ක් එනම් රු.536,774 ක් අඩුකර ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 70,968,421 | තැන්පත් කර වසර 2 ට වැඩි කාලයක් ඉක්මවූ ආයතන 10 කට අදාළ පොදු තැන්පතු ශේෂ 459 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | පළාත් මූල්‍ය රීති | | |
| | (i) 259.2 රීතිය | 277,815,207 | ගිණුම් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් පියවා ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊලඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත පියවිය යුතුය. එහෙත් රු.392,441,520 ක නොපියවූ අග්‍රිම ගිණුම් ශේෂයෙන්, එකතුව රු.277,815,207 ක් වූ අග්‍රිම ශේෂ 03 ක් 2018 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි. |
| | (ii) 282.3 රීතිය | | විධිමත් පරිදි පිළියෙළ කල බැංකු සැසඳුම් ප්‍රකාශ ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළ බැංකු ගිණුම් 03 ක අවස්ථා 29 කදී එම අවශ්‍යතාවය ඉටුවන පරිදි කටයුතු කර නොතිබුණි. |
| | (iii) 283.4 රීතිය | 4,919,377 | ආයතන 05 ක බැංකු ජංගම ගිණුම් 15 කට අදාළව නිකුත් කර තිබුණු නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලය ඉක්මවූ චෙක්පත් 345 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඈ) චක්‍රලේඛ

| | | |
|---|---|---|
| (i) 2012 ජනවාරි 02 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන වගන්තිය | 9,065,512 | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ආයතනවල විවිධ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී ව්‍යාපෘති 09 ක් අනුමත සමිති හරහා සිදු කරවා ගෙන තිබුණද, ප්‍රජා පාදක සංවිධානවලට සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් අදාළ සමිතිවල යෝග්‍යතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසු ප්‍රජා පාදක සංවිධානවලට වැඩ කොන්ත්‍රාත් පැවරීම නිර්දේශ කළ යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ii) 2001 අගෝස්තු 23 දිනැති අංක 18/2001 රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ ලේකම්ගේ චක්‍රලේඛය. | | ඒකාබද්ධ සේවා, පළාත් රාජ්‍ය සේවා හා දෙපාර්තමේන්තුමය සේවා යන සේවාවන්හි නිළධාරීන්ගේ ස්ථාන මාරු පිළිබඳ පොදු ප්‍රතිපත්තිය අනුව එක් සේවා ස්ථානයක උපරිම කාලසීමාව අවුරුදු 05 ඉක්මවූ නිළධාරීන් වහාම මාරු කලයුතු වුවත්, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන,නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා, අමාත්‍යාංශයේ නිළධාරීන් 30 දෙනෙකු වසර 06 සිට වසර 19 දක්වා කාලයක් එහි සේවය කර තිබුණි. |

(ඉ) 2006 ප්‍රසම්පාදන
මාර්ගෝපදේශ සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) 2.9.1ඡේදය | 366,500 | ටෙන්ඩරයට අදාළ ලේඛන පරීක්ෂා කිරීම හෝ වෙනත් කවර හෝ වැඩක් සාමාජිකයින් විසින් සාමාන්‍ය වැඩ කරන වේලාවෙන් පරිබාහිරව සිදුකළ යුතු අතර, ගෙවීමට හිමිකම් ලැබීම සඳහා ගනු ලබන ටෙන්ඩර් තීරණයට අදාළව අවම වශයෙන් දෙවතාවක් සාමාන්‍ය වැඩ වේලාවෙන් පරිබාහිරව රැස්වීම අනිවාර්ය වුවද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ගනු ලබන සියලුම ප්‍රසම්පාදන රැස්වීම් හා තීරණ රාජකාරී වේලාව තුළ සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 08 දෙනෙකුට දීමනාද ගෙවා තිබුණි. |
| (ii) 3.6.1 ඡේදය | 3,990,000 | මූලික ප්‍රසම්පාදන දිනයේ සිට මාස 06 ක් ඇතුළත මූලික ප්‍රසම්පාදන වටිනාකමින් සියයට 50 ක් දක්වා නැවත ඇනවුම් කළ හැකි වුවද, ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඔපරේෂන් මයික්‍රස්කෝප් (Operation Micrescope) යන්ත්‍ර 2 ක් මිලදී ගෙන තිබුණි. |

2.2.7 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
--------------------------------------------------------------

(අ) දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන ආයතන සභිකයින්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන.

(i) දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අදියර දෙකකදී යතුරුපැදි හා ස්කූටර් 628 ක් නිකුත්කර තිබුණි. මේ අනුව දිස්ත්‍රික්ක 3 හි පිහිටි පළාත් පාලන ආයතන 27 ක් සඳහා අනුමත සභික සංඛ්‍යාවට වඩා යතුරුපැදි හා ස්කූටර් 55 නිකුත්කර තිබුණි.

(ii) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පළවෙනි අදියරේදී යතුරු පැදි ලබාදුන් සභිකයින් 166 ක් යතුරුපැදිය සඳහා ගෙවිය යුතු මුදල් 2017 නොවැම්බර් 8 දින දක්වා ගෙවා නොමැති බව තහවුරු විය. මේ අනුව රජයට අයවිය යුතු මුදල රු.8,290,000 ක් විය.

(iii) පළමු අදියරේ යතුරුපැදි ලබාදුන් පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් 29 ක් යතුරුපැදි සඳහා මුදල් ගෙවූ බව දක්වා ඇතත් ඔවුන් මුදල් ගෙවූ දිනය හෝ ඊට අදාළ කුවිතාන්සි අංකය දක්වා නොතිබුණි.

(iv) රජයේ නිළධාරීන් වශයෙන් යතුරුපැදි ලබාගත් නිළධාරීන් පළාත් පාලන ආයතන සභිකයින් ලෙසද නැවත යතුරුපැදි ලබාගත් අවස්ථා නිරීක්ෂණය විය. නියැදි විගණන පරීක්ෂාවේදී එවැනි නිළධාරීන් 7 ක් පිළිබඳ තොරතුරු අනාවරණය විය.

(v) යතුරුපැදි ලබාදීමේදී අයකරනු ලබන මුදල් කඩිනමින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අයකරගන්නා ලද රු.500,000 ක මුදලක් 2017 නොවැම්බර් 15 දින දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ආ) 2011 මැයි 11 දිනැති අංක ජී/එස්පී/1/15 දරන ආණ්ඩුකාර ලේකම්ගේ ලිපිය පරිදි දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළ විෂයයක් වූ කාර්ය පරිපාටික රීති මාලාවක් සකස් කොට අනුමත කර ගන්නා තෙක් අවශ්‍ය වෙනස්කම් සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති අනුගමනය කිරීමට ආණ්ඩුකාරතුමියගේ එකඟතාවය ලැබී ඇති බව දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කාර්ය පරිපාටික රීති මාලාවක් සකස් කර නොතිබුණි.

(ඇ) වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියේ නිළධාරියෙකු සහ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා එම සේවාවේ II / III පංතියේ නිළධාරියෙකු අනුමත කර සේවයේ නිරතව සිටියදී පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් අධීක්ෂණය සඳහා දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙත අධීක්ෂණ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.608,350 ක් ගෙවා තිබුණි. තවද පළාත් සභාවේ පුහුණු කටයුතු පිළිබඳ අධීක්ෂණය ඔහුගේ නිත්‍ය රාජකාරියක් වන බැවින් ඒ සඳහා ඔහුට අමතර දීමනාවක් ගෙවීම අවිධිමත් විය.

(ඈ) පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික විසර්ජන ප්‍රඥප්තියෙන් බලය ලබාදුන් සීමා නොපිළිපැද තිබූ අවස්ථා පහත දැක්වේ.

(i) වියදමේ උපරිම සීමාව රු.113,951 ත් රු.3,092,770 ත් අතර පරාසයක් තුළ ඉක්මවන ලද අවස්ථා 3 ක් පැවතුණි.

(ii) ලැබීම්වල අවම සීමාව කරා රු.130 කින් හා රු.243,368 කින් ළඟා නොවූ අවස්ථා 2 ක් පැවතුණි.

(iii) හර ශේෂයේ උපරිම සීමාව රු.833 ත් රු.20,501,431 ත් අතර පරාසයක් තුළ ඉක්මවා තිබුණු අවස්ථා 5 ක් පැවතුණි.

3. ආදායම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක පළාත් සභාව විසින් උපයාගෙන තිබුණු බදු සහ බදු නොවන ආදායම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බදු ආදායම | 7,724 | 6,440 | 5,654 | 4,864 | 4,039 |
| බදු නොවන ආදායම | 1,068 | 789 | 650 | 546 | 717 |
| එකතුව | 8,792 | 7,229 | 6,304 | 5,410 | 4,756 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායම පිළිවෙලින් රු. මිලියන 1,284 කින් හා රු.මිලියන 279 කින් එනම් සියයට 20 කින් හා සියයට 35 කින් වර්ධනයවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ ආදායම් විස්තරයක් පහත දැක්වේ.

| ආදායම් විස්තරය | 2017.01.01 දිනට ශේෂය | වර්ෂයේ තක්සේරුව | වර්ෂය තුළ රැස් කිරීම් | වර්ෂය තුළ නිදහස් කිරීම් | 2017.12.31 දිනට ශේෂය | අයකිරීම් ප්‍රතිශතය | නිදහස් කිරීම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % | % |
| දේපළ පැවරීම මත මුද්දර බද්ද | 827.7 | 409.2 | 118.3 | 388.8 | 730.4 * | 9.56 | 31.43 |
| බණිජ අයිතීන් මත බදු | 4.8 | 5.8 | 0.7 | 6.4 | 5.2 * | 6.6 | 60.38 |
| ව්‍යාපාර පිරිවැටුම් බදු | 41.7 | - | 0.9 | 3.9 | 36.9 * | 2.16 | 9.35 |
| ඖෂධ වෙළෙඳුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1.9 | 1.7 | 0.8 | 0.4 | 2.3 * | 22.22 | 11.11 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| රජයේ ගොඩනැගිලි කුලී | 1.4 | 0.6 | 0.6 | - | 1.4 | 30.00 | - |
| උසාවි දඩ මුදල් | - | - | - | - | 93.3 | - | - |
| පෞද්ගලික බස්රථ සඳහා අයකරන ගාස්තු | 3.0 | 2.4 | 1.5 | - | 3.9 | 27.78 | - |
| | --------- | --------- | -------- | -------- | ------- | | |
| එකතුව | 880.5 | 419.7 | 122.8 | 399.5 | 873.4 | | |
| | ===== | ====== | ===== | ==== | ==== | | |

* 2017 දෙසැම්බර් 31 දිනට හිඟබදු ශේෂය සකස් කිරීමේදී තක්සේරු කිරීම්, අයකිරීම් සහ දඩ නිදහස් කිරීම් වලට අමතරව හර නිවේදන හා දඩ හර ගැලපීම් මඟින් අවසාන බදු ශේෂ ගණනය කර ඇත.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දේපළ පැවරීම මත මුද්දර බදු ආදායමට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ හිඟ ශේෂයෙන් හා වර්ෂයේ තක්සේරු කරන ලද ආදායමෙන් සියයට 9.56 ක් රැස්කර තිබුණු අතර, සියයට 31.43 ක් නිදහස් කර තිබුණි.

(ii) ඛණිජ අයිතීන් මත බදු ආදායමට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ හිඟ ශේෂයෙන් හා වර්ෂයේ තක්සේරු කරන ලද ආදායමෙන් සියයට 6.6 ක් රැස්කර තිබුණු අතර, සියයට 60.38 ක් නිදහස් කර තිබුණි.

(iii) ව්‍යාපාර පිරිවැටුම් බදු ආදායමට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති හිඟ ශේෂයෙන් සියයට 2.16 ක් රැස්කර තිබුණු අතර, සියයට 9.35 ක් නිදහස් කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ තක්සේරු කරන ලද ආදායමෙන් හා හිඟ ශේෂයෙන් අඩු ප්‍රතිශතයක් අයවන විට ඊට වඩා වැඩි ප්‍රතිශතයක් නිදහස් කර ඇති බව ඉහත අංක (ආ) (i) සිට (iii) දක්වා වූ නිරීක්ෂණ මත තහවුරු විය.

(v) සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවට අයත් රජයේ ගොඩනැගිලි වලින් අයවිය යුතු රු.මිලියන 1.4 ක හිඟ ගොඩනැගිලි කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික බස්රථ හිමියන්ගෙන් අයවිය යුතු රු.මිලියන 3.9 ක් වූ හිඟ ටෙන්ඩර් ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දින වන විට සුරාබදු බලපත්‍රවලට අදාළව එකතුව රු.17,314,302 ක් වූ හිඟ ආදායම් පැවති අතර එම හිඟ ආදායම්, රා තැබෑරුම් රේන්ද, රා මැදීමේ බලපත්‍ර සහ මෙරට හා පිටරට මත්පැන් තැබෑරුම් රේන්ද යන ආදායම් සංකේත වලින් කුමන ආදායම් සංකේතයට අදාළද යන්න වර්ගීකරණය කර නොතිබුණි.

4. මූල්‍ය සමාලෝචනය

----------------------

4.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.422,079,412 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ නැවත ප්‍රකාශිත ඌනතාවය රු.2,423,457,764 ක් විය.

5. වාණිජ අත්තිකාරම් ගිණුම්

-----------------------------

දකුණු පළාත් සභාවට අයත් ආයතන තුළ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 10 ක් ක්‍රියාත්මකව තිබූ අතර, ඒ පිළිබඳ නිරීක්ෂණ පහත පරිදි විය.

(අ) වාණිජ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික විසර්ජන ප්‍රඥප්තියෙන් බලය ලබාදුන් සීමා නොපිළිපැද තිබූ අවස්ථා පහත දැක්වේ.

(i) වර්ෂය අවසාන හර ශේෂයේ උපරිම සීමාව රු.79,212 ත් රු.13,223,657 ත් අතර පරාසයක් තුළ ඉක්මවන ලද අවස්ථා 6 ක් විය.

(ii) ලැබීම්වල අවම සීමාවට, අවස්ථා 2 කදී පිළිවෙලින් රු.947,200 කින් සහ රු.1,236,027 කින් ළඟාවී නොතිබුණි.

(ආ) (i) සමාලෝචිත වර්ෂයේදී කල්පිත ගාස්තු ගැලපීමට පෙර එකතුව රු.116,699,765 ක ලාභයක් සහිත අත්තිකාරම් ගිණුම් කටයුතු 10 ක් වූ අතර, ඊට කල්පිත ගාස්තු ගැලපූ පසු එකතුව රු.210,804,497 ක අලාභයක් පෙන්නුම් කළ ගිණුම් කටයුතු ගණන 05 ක් විය.

(ii) විෂයය අංක 31502 දරන සහතික කළ බීජ හා වගා ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුමට අදාළව ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල්පිත ගාස්තු ගලපා නොතිබුණි.

6. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

6.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බලපත්‍රලාභී ආයතන 03 කින් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සුරාබදු බලපත්‍ර ගාස්තුව, දඩ මුදල හා මුද්දර ගාස්තු වශයෙන් එකතුව රු.3,480,900 ක් සහ සුරාබදු උපාංගික බලපත්‍ර වෙනුවෙන් රු.100,000 ක් බැගින් වූ ගාස්තු 2017 නොවැම්බර් 28 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් දීර්ඝකාලීන බදු මුදල් අයකරගැනීම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබාදී තිබූ ඉඩම් වෙනුවෙන් බදු හා දඩ වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහා බදුකරුවන් 06 දෙනෙකුගෙන් රු.935,138ක මුදලක්ද සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ වෙනුවෙන් බදුකරුවන් 03 දෙනෙකුගෙන් රු.860,404 ක මුදලක් ද අයකරගෙන නොතිබුණි.

(ii) වගකිව යුතු ආයතන වලින් නිසි අවසරයක් ලබා ගැනීමකින් තොරව පෞද්ගලික දුරකථන සමාගමක් විසින් බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රජයේ ඉඩමක 2013 වර්ෂයේදී ඉදිකරන ලද දුරකථන සම්ප්‍රේෂණ කුළුනක් සඳහා දීර්ඝකාලීන බදුකරයක් පිළියෙල කර පළාත් සභාවට බදු ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ලබාදුන් රු.2,000,000 ක ප්‍රතිපාදන මත 2016 වර්ෂයේදී ඉදිකිරීම් නිමකළ උක්ත ගිලන් කුටිය සඳහා ස්ථිර විදුලි සම්බන්ධතාවයක් 2018 අප්‍රේල් වන විටත් ලබා දී නොතිබුණි. එම නිසා අසල පිහිටි ගොඩනැගිල්ලකින් තාවකාලික විදුලි සම්බන්ධතාවක් අනාරක්ෂිතව සපයා ගනිමින් ගිලනුන්ගේ උපස්ථාන සිදුකරමින් තිබුණි.

(ඇ) දකුණු පළාත් සෞඛ්‍ය සේවාවට අයත් ප්‍රාදේශීය ඖෂධ ගබඩා සහ අනෙකුත් සෞඛ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක ඖෂධ කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) ප්‍රාදේශීය ඖෂධ ගබඩා 2 ක, මූලික රෝහල් 4 ක හා පළාත තුළ පිහිටි රෝහල් හා සෞඛ්‍ය ආයතන 39 ක 2016 දෙසැම්බර් 31 දිනට පැවති කල්ඉකුත් වූ ඖෂධ තොගයේ වටිනාකම රු.19,988,383 ක් විය.

(ii) දකුණු පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ඖෂධ ගබඩා 03 ක, මූලික රෝහල් 04 ක හා අනෙකුත් රෝහල් හා සෞඛ්‍ය ආයතන 60 ක පැවති තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ තොගයේ වටිනාකම රු.10,173,634 ක් විය. මේවා හොඳ තත්ත්වයේ ඖෂධ සමග එකට ගබඩාකර තිබුණි.

(iii) 2017 ජුනි 25 දින වන විට හම්බන්තොට ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ කල්ඉකුත් වූ කැල්සියම් ලැක්ටේට් පෙති (Tab Calcium Lactate) 996,000 ක් පැවතුණි. නමුත් තොග ලේඛණ අනුව මෙම ප්‍රමාණය පෙති 946,000 ක් විය.

(iv) දකුණු පළාත් මූල්‍ය රීති 57 (අ) (ii) ට අනුව කල් ඉකුත් වූ ඖෂධ තොග අපහරණය සඳහා කමිටුවක් පත් කිරීම දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය යටතේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකළ යුතු වුවත් ඊට අනුකූල නොවී දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ විසින් කමිටුවක් පත්කර හම්බන්තොට ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ පැවති රු.1,325,422 ක් වටිනා කල්ඉකුත් වූ ඖෂධ තොගයෙන් කොටසක් විනාශ කර තිබුණි.

(v) දකුණු පළාත තුළ පිහිටි රෝහල් හා සෞඛ්‍ය ආයතන 44 ක ඖෂධ ගබඩා වායුසමනය කර නොතිබුණු අතර ආයතන 64 ක අධිශීතකරණ පහසුකම් නොවිය. රෝහල් හා සෞඛ්‍ය ආයතන 49 ක විදුලි ජනන යන්ත්‍ර නොතිබුණු අතර ආයතන 4 කට ලබා දී තිබුණු විදුලි ජනන යන්ත්‍ර අක්‍රිය වී තිබුණි.

(vi) භාවිතය තාවකාලිකව අත්හිටුවා තිබුණු Colostomy bags (30mm) නැමැති ශල්‍ය උපකරණයේ 1306 L කාණ්ඩයේ ඒකක 180 ක් හා 1361 J කාණ්ඩයේ ඒකක 300 ක් හම්බන්තොට ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ පැවති බව වාර්තා වී තිබුණි. භාවිතය අත්හිටවූ මෙම ශල්‍ය උපකරණය නැවත භාවිතයට නුසුදුසු වුවත්, ඉන් ඒකක 200 ක් තංගල්ල මූලික රෝහලට නිකුත් කර තිබුණි. එසේම භෞතික ශේෂයේ ඒකක 80 ක ඌණතාවයක්ද පැවතුණි.

(vii) හම්බන්තොට ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ 2013 වර්ෂයේදී සමීක්ෂණ මණ්ඩලයක් මගින් අනුමත කර විනාශ කිරීමට යෝජිත ඖෂධ වර්ග භාරදීමේදී අයිතම 11 කට අයත් ඒකක 91173 ක් අඩුවෙන් භාර දී තිබුණි. මෙම ඌණතාවයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් පාඩුව අයකර ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදුකර නොතිබුණි.

(viii) කඹුරුපිටිය මූලික රෝහලේ 2017 ජුනි 27 දින වන විට 2017 අප්‍රේල් 16 දින කල්ඉකුත් වූ Cefuroxime Axetile Tablets USP 125mg නැමති ඖෂධයේ ඒකක 2500 ක් භෞතිකව පැවතියද තොග ලේඛන අනුව එවැනි තොග ශේෂයක් නොවිය. බාහිර රෝගී අංශයේ රෝගීන් වෙත ඖෂධ නිකුත් කිරීමේදී මෙම වර්ගයේ පෙති සත්‍ය ලෙස නිකුත් කළ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් තොග ලේඛනවලින් අඩුකර ඇති බව නියැදි පරීක්ෂාවේදී තහවුරු විය.

(ඉ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් 2014 වර්ෂයේදී හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණු මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.18,742,215 ක් වැයකර ඉදිකරන ලද වීරකැටිය හා කටුවන ආදාහනාගාර අදාළ ප්‍රාදේශීය සභා වෙත 2017 මාර්තු 03 දින භාර දී ඇතත්, එකී ආදාහනාගාර මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කිරීමේ කටයුතු 2017 අගෝස්තු මස දක්වා සිදුකර නොතිබුණි.

(ඊ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ලබාගත් පාසල් ලේඛනයට අනුව දකුණු පළාත තුළ පළාත් සභා පාසල් 1048 ක් පවතින අතර ඉන් පාසල් 169 කට අදාළව විගණනය මගින් ඉල්ලුම්කරන ලද තොරතුරු 2017 දෙසැම්බර් 15 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. විගණනයට තොරතුරු ඉදිරිපත් කරන ලද පාසල් ලේඛනයට ඇතුළත් නොවූ පාසැල් 08 ක් ඇතුළුව පාසැල් 887 හි තොරතුරු විශ්ලේෂණය කිරීමේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) අධ්‍යාපනික කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකව අවශ්‍යවන සිසුන්ගේ, ගුරුවරුන්ගේ, පුස්තකාල සහ කාර්යාල මේස හා පුටු, ඌනතාවයක් පැවතුණු පාසල් 479 ක් වූ අතර, අතිරික්තයක් පැවතුණු පාසල් 38 ක් විය.

(ii) පංති කාමර සහිත ගොඩනැගිලි විද්‍යාගාර, ගෘහ විද්‍යාගාර, කෘෂි ඒකක, පරිගණක ඒකක වැනි ගොඩනැගිලි ඌනතාවයන් පැවති පාසැල් 466 ක් වූ අතර සමහර පාසල්වල පවතින ගොඩනැගිලි නියමිත ප්‍රමිතියට නොතිබූ අවස්ථාද පැවතුණි.

(iii) භාවිතයට නුසුදුසු තත්ත්වයේ ගොඩනැගිලි පවතින පාසල් 372 ක් වූ අතර, ගොඩනැගිලි ඌනතාවය හේතුවෙන් තවදුරටත් එම ගොඩනැගිලි භාවිතා කරමින් පැවතුණි.

(iv) සිසුන්ගේ සහ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සනීපාරක්‍ෂක පහසුකම් දුර්වල මට්ටමක පැවති පාසල් 284 ක් වූ අතර පිරිසිදු පානීය ජලය ලබාගැනීමේ ගැටළු පැවති පාසල් 289 ක් විය. පාසල් කාලය පුරා නිසිලෙස ජලය නොලැබීම, පවතින ජලය දවස පුරා භාවිතයට ප්‍රමාණවත් නොවීම, ලැබෙන ජලය බීමට සුදුසු තත්ත්වයක නොපැවතීම හා නල ජලය ලබාගන්නා අවස්ථාවලදී ජලය ගබඩාකර තබා ගැනීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම වැනි හේතූන් මත මෙසේ ජල ගැටළු උද්ගත වී තිබුණි.

(v) පාසල් 11 ක ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් තිබියදී ළඟම පාසල හොඳම පාසල (NSBS) ව්‍යාපෘතිය යටතේ හා අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ තවදුරටත් අලුතින් වැසිකිළි ඉදිකෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. මේ අනුව අධ්‍යාපන බළධාරීන් විසින් පාසල්වල පවතින අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු නොකර නව වැසිකිළි ඉදිකිරීම් සඳහා පාසල් තෝරාගෙන තිබුණි.

(vi) පාසල් 297 ක පමණ ඉගැන්වීමේ කටයුතු නියමිත පරිදි කරගෙන යෑම සඳහා අවශ්‍ය ගුරුවරුන්ගේ ඌනතාවයන් මෙන්ම අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ ඌනතාවයන් පැවතුණි. සමහර පාසල්වල මෙම ගුරු ඌනතාවයන් වර්ෂ ගණනාවක සිට පවතින අතර නිසි ගුරු තුලනයන් තුළින් බොහෝ දුරට මෙම ගැටළුව විසඳීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය විය.

(Vii) දකුණු පළාත තුළ පිහිටි පාසල් රාශියක ඉගෙනුම ලබන සිසුන් ප්‍රමාණය අඩු වීම නිසා අඩු සිසුන් සංඛ්‍යාවක් යටතේ පාසල් පවත්වාගෙන යාම තුළ එකී පාසල් සඳහා ලබා දී තිබෙන භෞතික සම්පත් සීමා වී තිබුණි. වැඩි සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල්වල සිසුන්හට ලැබෙන බොහෝ පහසුකම් මෙම පාසල් සඳහා ලැබී නොතිබුණි. එසේම අනුයුක්ත මානව සම්පත් ඌන උපයෝජනයකට ලක් වී තිබුණි. තවත් සමහර අවස්ථාවලදී අවශ්‍ය මානව සම්පත් ලැබී නොතිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සිසුන් 100 කට අඩු පාසල් 169 ක් පැවතුණි. මේ පිළිබඳව සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

| ශිෂ්‍ය සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව |
|---|---|
| සිසුන් 02 – 10 දක්වා | 05 |
| සිසුන් 11 – 20 දක්වා | 21 |
| සිසුන් 21 – 50 දක්වා | 72 |
| සිසුන් 51 – 99 දක්වා | 71 |
| එකතුව | 169 |

(viii) පාසල් 07 ක පාසල් භූමිය හරහා පුද්ගලික නිවාස සඳහා ගමන් කිරීමට මාර්ග පිහිටා තිබූ බැවින් පාසල් සිසුන්ගේ මෙන්ම පාසලේ පවතින භෞතික සම්පත්වල ආරක්ෂාව කෙරෙහි මෙය ප්‍රමාණවත් ලෙස බලපා තිබුණි.

(ix) ගා / දොරපේ මහා විද්‍යාලය ආසන්නයේ පවතින රබර් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් තුළින් වහනය වන අධික දුර්ගන්ධය හේතුවෙන් පාසල් කටයුතු පවත්වාගෙන යාමට බාධා එල්ල වී තිබුණි.

(උ) 2017 වර්ෂය තුළ අවස්ථා දෙකකදී රුහුණු සංචාරක කාර්යාංශයේ වැඩ බලන කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් හා ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී පත්කර තිබුණි. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.1 (අ) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු නොලබන නිලධාරියෙකු වැඩ බැලීමේ තනතුරකට පත්කිරීමේදී එය සිදුකල යුත්තේ පත්වීම් බලධාරියා විසින් වුවද, අදාළ පත්කිරීම් සඳහා පත්කිරීම් බලධාරියාගේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ v වන පරිච්ඡේදයේ අංක 2 වගන්තිය පරිදි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 142 වගන්තිය පරිදි පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් මුදාහැරීමකින් තොරව ඉහත පරිදි වැඩ බැලීමට පත්වීම් කර තිබුණි.

(ඌ) මව් සෞඛ්‍ය සමාජ සංවර්ධන වැඩ සටහන සඳහා 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරුසේවා අමාත්‍යාංශය මඟින් රු.මිලියන 50.8 ක් වැය කර තිබුණු අතර එක් එක් වැඩසටහනේ සාර්ථකත්වය ඇගයීම සඳහා කාර්ය සාධන දර්ශක තීරණය කර නොතිබුණු බැවින් මෙම වැඩසටහනේ සාර්ථකත්වය හා අපේක්ෂිත අරමුණ ඉටුවී තිබේද යන්න අනාවරණය කර ගත නොහැකි විය.

(එ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ගාල්ල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ කාර්යාලය යටතේ සේවය කරන ලද පශු වෛද්‍ය නිලධාරිනියක 2011 අගෝස්තු 12 දින සිට 2013 අගෝස්තු 27 දින දක්වා වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා ගෙන විදේශ ගත වී තිබුණි. නැවත සේවයට වාර්තා නොකිරීම මත 2013 සැප්තැම්බර් 25 දින සිට සේවය අතහැර ගියාසේ සලකා කටයුතු කරන බව පළාත් අධ්‍යක්ෂක විසින් දන්වා තිබුණද, ඒ සම්බන්ධව නිලධාරිනියගෙන් ප්‍රතිචාරයක් නොවීම මත 2014 මාර්තු 20 දින ගිවිසුම්ගත අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගෙවිය යුතු බවට එකඟ වූ රු.397,920 ක මුදල ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දින දක්වාම එකී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර තනතුරු අත්හැර යාමේ නිවේදනයක්ද නිකුත් කර නොතිබුණි.

(ඒ) මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රිදියගම සත්ත්ව ගොවිපලට අයත් ඉඩමෙන් හෙක්ටයාර් 0.0818 ක කොටසක පොකුණු 09 ක් ඉදි කිරීම, මුර නිවාසයක් ඉදි කිරීම සහ ලොරියක් මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.27,502,824 ක් වැයකර තිබුණද, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය විසින් කර්මාන්ත තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහා 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.4,328,667ක මුදලක් වැය කර තිබුණි. එහෙත්, තොරතුරු පද්ධතිය නිර්මාණය කරන ලද ආයතනයට පමණක් පද්ධතියේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට හැකියාව පැවතීම සහ අධිකාරියට අවශ්‍ය පරිදි පද්ධතිය යාවත්කාලීන කිරීමට හැකියාවක් නොතිබීම නිසා දරන ලද වියදම ඵලදායී නොවන වියදමක් බවට පත් වී තිබූ අතර ඒ අනුව, ආයතනයේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඔ) කුඩාවැල්ල පසු අස්වනු නිෂ්පාදන ආයතනයක් ආරම්භ කිරීමට ගොඩනැගිලි නවීකරණයන් හා උපකරණ මිලදී ගැනීම සඳහා දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ධීවර සත්ත්ව නිෂ්පාදන සහ සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.11,112,600 ක මුදලක් වැයකර තිබුණද, පසු අස්වනු මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය විසින් පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාව අනුව 2017 දෙසැම්බර් 25 දිනෙන් පසුව රු.44,909,000 ක් වූ නව වැඩ යෝජනා 61ක් අනුමත කර තිබුණි.

6.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

ප්‍රධාන කාර්යයෙන් බැහැර ක්‍රියාකාරකම්

--------------------------------------------

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතින් පැවරී ඇති බලතල යටතේ නීතිය හා සාමය සුරක්ෂිත කිරීම දකුණු පළාත් සහා ප්‍රදේශයේ සාමාන්‍ය ආරක්ෂාව සහතික කිරීම හා ඒ සඳහා සිවිල් පාලනයට සහායවීම ප්‍රධාන අමාත්‍ය මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වන නමුත් නීතිය හා සාමය වැය විෂයය යටතේ වෙන්කළ ප්‍රතිපාදන වලින් රු.2,584,000 ක් වැයකර ප්‍රධාන ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් සඳහා නෙස්කැෆේ මැෂින් 21 ක්, බුෆේ සෙට් 19 ක් හා ප්ලාස්ටික් පුටු 950 ක් මිලදී ගෙන බෙදාදී තිබුණි.

6.3 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

------------------------------------------------

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වතුගෙදර - සීනිගොඩ මාර්ගය හා ගා/විද්‍යා සමාධි මහා පිරිවෙනට පිවිසෙන මාර්ගය නවීකරණය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ලබා දී තිබුණු මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද වතුගෙදර - සීනිගොඩ මාර්ගය නවීකරණයට අදාළ ඇස්තමේන්තු සකස් කිරීමේදී සාවද්‍ය ඒකක මිලක් මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් මෙම මාර්ගයට සැපයූ ඇස්පෝල්ට් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.485,040 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) නවීකරණය කරන ලද මාර්ග 2 හි කළවැඩ මිනුම් ගැනීමේදී සාවද්‍ය ලෙස මිනුම් ලබාගැනීම හේතුවෙන් රු.140,560 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුට එකතුකළ අගය මත බදු මුදල් ලෙස රු.1,991,716 ක් ගෙවා ඇතත් කොන්ත්‍රාත්කරුගෙන් විධිමත් බදු ඉන්වොයිස් ලබාගෙන නොතිබුණි. විගණන විමසුම නිකුත් කිරීමෙන් පසුව ලබාගත් බදු ඉන්වොයිස්වල පිටපත් විගණනයට ඉදිරිපත් කර ඇතත් ඒවායේ ඇතුළත් විය යුතු ඉන්වොයිස් අංක, දිනය, නම, ලිපිනය, පිළියෙල කළ අයගේ අත්සන සහ බලයදුන් අයගේ අත්සන යන කරුණු කිසිවක් ඇතුළත් නොවීය. මෙම හේතුව මත මෙම බදු මුදල් නියමිත පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවූ බව තහවුරු කරගැනීමට නොහැකි විය.

6.4 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී සියයට 50 ඉක්මවූ ඉතිරි කිරීම් දැක්වෙන වැය විෂයයන් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය සහ ඉන් දරන ලද වියදම් සහ ඉතිරිවූ ප්‍රතිපාදන පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වියදම් විස්තරය | වැය විෂයයන් ගණන | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන වියදම් | 151 | 1,233,888,881 | 468,662,969 | 765,225,912 | 62 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 31 | 505,228,164 | 109,364,712 | 395,863,452 | 78 |
| මූලධන වත්කම් අත්පත් කරගැනීම් | 5 | 85,310,938 | 15,379,239 | 69,931,699 | 82 |
| පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 10 | 539,227,105 | 215,672,316 | 323,554,789 | 60 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් පුනරාවර්තන වියදම්

(i) ශීර්ෂ 12 කට අයත් වැය විෂයයන් 34 ක් වෙනුවෙන් සලසා තිබුණු එකතුව රු.124,437,000 ක් වූ සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) ශීර්ෂ 17 කට අයත් වැය විෂයයන් 117 ක් වෙනුවෙන් සලසා තිබූ එකතුව රු.1,109,451,881 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වියදම් දැරීමෙන් අනතුරුව සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක වූ එකතුව රු.640,788,912 ක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.

(ආ) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්

(i) ශීර්ෂ 07 කට අයත් වැය විෂයයන් 13 ක් යටතේ සලසා තිබුණු එකතුව රු.124,764,600 ක් වූ සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) ශීර්ෂ 7 කට අයත් වැය විෂයයන් 18 ක් වෙනුවෙන් සලසා තිබූ එකතුව රු.380,463,564 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වියදම් දැරීමෙන් අනතුරුව සියයට 55 සිට සියයට 96 දක්වා පරාසයක වූ එකතුව රු.271,098,852 ක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.

(ඈ) මූලධන වත්කම් අත්පත් කරගැනීම්
--------------------------------------------

ශීර්ෂ 04 කට අයත් වැය විෂයයන් 05 ක් වෙනුවෙන් සලසා තිබූ එකතුව රු.85,310,938 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 66 සිට සියයට 100 දක්වා පරාසයක වූ එකතුව රු.69,931,699 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ඈ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන
------------------------------------------

ශීර්ෂ 04 කට අයත් වැය විෂයයන් 10 ක් වෙනුවෙන් සලසා තිබූ එකතුව රු.539,227,105 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 92 දක්වා පරාසයක වූ එකතුව රු.323,554,789 ක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.

6.5 නිෂ්කාර්ය හා ඌණ උපයෝජිත වත්කම්
--------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බලපිටිය මූලික රෝහලේ රුධිර කාන්දු පෙරන ඒකකය ස්ථාපිත කිරීම සඳහා 2016 හා 2017 වර්ෂවලදී මිලදීගෙන තිබුණු රු.8,229,850 ක් වටිනා වෛද්‍ය උපකරණ 15 ක් 2018 මැයි 30 දින දක්වාම නිශ්කාර්යව පැවතුණි.

(ආ) පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති 02 ක් මගින් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකතුව රු.7,857,860 ක් වූ පාසැල් බෑග් 8552 ක්, එකතුව රු.3,773,400 ක් වූ අභ්‍යාස පොත් 19348 ක් හා අභ්‍යාස පොත් කට්ටල 6026 ක් සහ එකතුව රු.3,638,201 ක් වූ පාසල් උපකරණ ප්‍රතිලාභීන් වූ පාසල් සිසුන් වෙත බෙදා නොහැර 2018 අප්‍රේල් 30 දින වන විටත් අමාත්‍යාංශ ගබඩාවේ හා කලාප අධ්‍යාපන කාර්යාලවල ගබඩා කර තිබුණි.

(ඇ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් තලුන්න පට්ටි මධ්‍යස්ථානය, තලුන්න ආදර්ශ කිරිගව ගොවිපලක් බවට පත් කිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.8,250,624 ක මුදලක් වැය කර තිබුණද, කිරිගව ගොවිපල ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික සාධක වන තෘණ, ජලය සහ මානව සම්පත් නොමැති වීමෙන් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

6.6 ආර්ථික නොවූ ගණුදෙනු

---------------------------

වක්වැල්ල කළමනාකරණ හා සංවර්ධන පුහුණු ආයතනය මඟින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකරනු ලැබූ අභ්‍යන්තර පුහුණු වැඩසටහන්වලට කැඳවන ලද නිළධාරීන්ගෙන් සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයක් සහභාගී වූ වැඩසටහන් 17 ක් නිරීක්ෂණය වූ අතර පුහුණු පාඨමාලාවලට කැඳවූ පුහුණුලාභීන් විසින් අදාළ පුහුණුව සඳහා සහභාගීවීමට නොහැකි අවස්ථාවලදී ඒ බව ලිඛිතව දන්වා නොතිබුණි. තවද සහභාගී නොවන නිලධාරීන් වෙනුවෙන් වෙනත් නිලධාරීන් සහභාගී කරවන බවක්ද නිරීක්ෂණය නොවුණි. පුහුණුව සඳහා පැමිණෙන ලෙස නිලධාරීන් වෙත ලිඛිතව දන්වා යැවූ ලිපියේ ඔවුන් සහභාගී නොවුනහොත් අදාළ වියදම ඔවුන්ගේ වැටුපෙන් අයකරගන්නා බව සඳහන්ව තිබුණද, එයද ඉටුවී නොතිබුණි.

6.7 ප්‍රසම්පාදනය

--------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම්, මිනිස්බල හා රැකීරක්ෂා අමාත්‍යාංශය විසින් කලායතන සඳහා ආධාර ලබාදීම යටතේ භාණ්ඩ මිලදී ගැනීමේදී ගුණත්වයෙන් අඩු භාණ්ඩ වැඩි මිලට මිලදී ගැනීම සිදු කර තිබුණි. මෙහිදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන තිබූ වාද්‍ය උපකරණ වර්ග 07 ක් සඳහා අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් රු.147,350 ක පාඩුවක් සිදු වී තිබුණු අතර 2017 පෙබරවාරි මස ලැබී තිබූ මෙම වාද්‍ය භාණ්ඩ මාස 08 ක කාල සීමාවක් තෙක්ම අදාළ කලායතන වෙත ලබා නොදී "සඳලිය" සංස්කෘතික මධ්‍යස්ථානයේ අනාරක්ෂිතව තබා තිබුණි. එලෙස මිලදී ගත් යක්බෙර 22 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති බව 2017 ඔක්තෝබර් 11 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම්, මිනිස්බල හා රැකීරක්ෂා අමාත්‍යාංශය විසින් ක්‍රීඩාසමාජවලට බෙදා දීම සඳහා රු.1,085,000 ක වටිනාකමකින් යුතු වොලිබෝල් කණු යුගල් 100 ක් මිලදී ගැනීමේදී පළමු ප්‍රසම්පාදන කමිටු තීරණ ගැනීමට පෙර ඒ සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශයන් ලබාගෙන නොතිබුණු අතර මෙම ඇණවුම සඳහා සැපයුම්කරු සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2017 අගෝස්තු මාසය තුළ මෙම වොලිබෝල් කණු දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන් වෙත ලබා දී තිබූ නමුත් 2017 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වන විටත් බොහොමයක් වොලිබෝල් කණු භාවිතයෙන් තොරව තැනින් තැන රඳවා තිබුණි.

6.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පිටබැද්දර අඹේවෙල පානීය ජල යෝජනා ක්‍රම ව්‍යාපෘතිය සඳහා වූ රු.786,000 ක් වූ ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 1, 2 සහ 3 සඳහා තාක්ෂණ නිලධාරී විසින් පිළිවෙලින් රු.185,082 ක්, රු.18,431ක් සහ රු.72,480 ක් වූ විශේෂ රේටයන් (Special Schedule Rate) සකස් කර දක්වා තිබුණද, එකී රේටයන් සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙතින් අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත්කාර සමිතිය වෙත රු.95,007 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) අමුගොඩ මධ්‍යම බෙහෙත් ශාලාවේ වෛද්‍ය නිල නිවාස අළුත්වැඩියාව සඳහා රු.1,411,015 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2012 ඔක්තෝබර් 18 දිනට පෙර නිම කිරීමට එකඟවී සමෘද්ධි සමිතියක් සමඟ 2012 අගෝස්තු 03 දින දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන , නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2012 නොවැම්බර් 17 දින වන විට රු.1,260,360 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. 2017 නොවැම්බර් 17 දින වන විටත් කර්මාන්තය නිමකර භාරදී නොතිබුණු අතර ගිවිසුම පරිදි කාර්ය සිද්ධි බැඳුම්කරය ලබාගෙන නොතිබුණි. සමෘද්ධි සමිතියේ සභාපතිගේ අත්සන වෙනත් අයෙකු විසින් යොදා බිල්පත් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) දකුණු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ නිල නිවාස ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඇස්තමේන්තු මුදල රු.202,250,000 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන රැස්වීමේදී නොකියවන ලද සියයට 13 ක වට්ටම් ප්‍රතිශතයක් තාක්ෂණික ඇගයීම් කමිටුවට ඉදිරිපත්කර ඒ අනුව කොන්ත්‍රාත් ආයතනයකට 2017 නොවැම්බර් 18 දින යථෝක්ත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) කොන්ත්‍රාත් ආයතනය ඉදිරිපත් කරන ලද සියයට 13 ක වට්ටම් ප්‍රතිශතය අනුව තිබිය යුතු වට්ටම සහ මුදලින් සඳහන් කර තිබුණු වට්ටම අතර, රු.1,804,084 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) නීත්‍යානුකූල නොවන සියයට 13 ක වට්ටම අඩුකිරීමේ වරද පිළිගැනීම නිසා ඊලඟ කොන්ත්‍රාත්කරුට කර්මාන්තය පිරිනැමීම සිදුකර තිබුණි.

(iv) 2017 නොවැම්බර් 30 දින මුල්ගල් තැබීමේ උත්සවය දක්වාම මූලික කටයුතු අධීක්ෂණය තාක්ෂණික සේවයේ නිලධාරීන් විසින් සිදුකර නොතිබුණි.

(ඈ) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන , නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය , සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය 2017 නොවැම්බර් 16 දින ඇස්තමේන්තු වටිනාකම රු.30,750,389 ක් වූ කර්මාන්ත 06 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් කිහිපදෙනෙකුගෙන් පමණක් මිල ගණන් කැඳවා තිබුණි. මිල ගණන් පිළිගැනීමට ප්‍රථම 2017 නොවැම්බර් 29 සිට දෙසැම්බර් 11 දක්වා කාලය තුළ කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භකර තිබුණි.

(ඉ) දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2016 මැයි 11 දිනැති අංක දපස/අඉමා/සැ.02/2015/09 දරන ලිපියෙන් කොන්ත්‍රාත් ආයතනයක් අසාදු ලේඛනගත කරන ලෙස (ICTAD) ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනය වෙත දන්වා තිබුණි. නමුත් දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ එම කොන්ත්‍රාත් ආයතනය සමඟ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා 2016 මැයි 13 දින ගිවිසුමක් අත්සන්කර තිබුණි. පළාත් මූල්‍ය රීති 432.2.1, 432.2.2 , 432.2.3 සහ 432.3 පරිදි අසාධු ලේඛන ගතකිරීමට වාර්තා කිරීම සහ අසාදු ලේඛන ප්‍රධාන ලේකම් විසින් සකස් කිරීම සහ නඩත්තු කිරීමද සිදුකර නොතිබුණි.

6.9 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සියලු ව්‍යාපෘති එම වර්ෂයේ නොවැම්බර් මස වන විට අවසන් විය යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති 21 ක වැඩ අවසන් කර නොතිබුණු අතර 2017 ඔක්තෝබර් වන විටත් ව්‍යාපෘති 25 ක වැඩ ආරම්භ කර හෝ නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ව්‍යාපෘති 28 ක් අවලංගු කිරීමට තීරණය කර තිබුණු අතර ආරම්භ කළ ව්‍යාපෘති 02 ක් නිම නොකර අත්හැර දමා තිබුණි.

6.10 විධිමත් පරිදි පවරා නොගත් දේපල

---------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජා ධීවර සම්මේලනය මඟින් තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉදිකර තිබූ රුවිනිගම ගොඩනැගිලි සංකීර්ණය බහුකාර්ය පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ කාර්යය සඳහා ධීවර සත්ත්ව නිෂ්පාදන සහ සංවර්ධන , පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය හා දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය විසින් 2016 හා 2017 වර්ෂවලදී රු.3,356,208 ක වියදමක් දරා තිබුණද, බහුකාර්ය පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. එමෙන්ම, ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය 2018 පෙබරවාරි මස දක්වාම කාර්මික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

6.11 අවිධිමත් ගණුදෙනු

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම්, මිනිස්බල හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ ලේකම්වරයාට ගෙවා තිබූ රු.174,080 ක ඉන්ධන දීමනාවට අමතරව 2017 ජනවාරි 21 දින සිට 2017 ඔක්තෝබර් 03 දින දක්වා අතිරේක ඉන්ධන සඳහා රු.302,080 ක් වැය කර තිබුණි.

(ආ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ මාතර දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග හා නිම නොවූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද මාර්ග සඳහා ඒබීසී (ABC) මිශ්‍ර ගල් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිදුකළ සෝදිසි පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) ව්‍යාපෘතියේ වැඩි දියුණු කරන ලද මාර්ගවලට අදාළ අනුමත ප්‍රමාණපත්‍ර වලට අනුව අවශ්‍ය ඒබීසී (ABC) මිශ්‍ර ගල් කියුබික් මීටර් 128602 ක් මිලදී ගැනීම සඳහා රු.556,097,678 ක් වැය කළ යුතුව තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.2 වගන්තියට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවක් මගින් මිලදී ගැනීම සඳහා තීරණ ගත යුතු වුවත්, ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියද නොමැතිව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව සියලු මිලදී ගැනීම් කර තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද මාර්ග සඳහා ඒබීසී (ABC) මිශ්‍ර ගල් සැපයීමේදී සිදු වී ඇති මූල්‍ය අක්‍රමිකතාවය අනාවරණය කිරීමෙන් පසුව මූලික පරීක්ෂණයක් සිදු කිරීම සඳහා ප්‍රධාන ලේකම් විසින් පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ පත් කර තිබුණි. ඔහුගේ වාර්තාවේ නිරීක්ෂණ හා නිගමන අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවී ඒබීසී (ABC) මිශ්‍ර ගල් මිලදී ගැනීම හේතුවෙන් නිලධාරීන් විසින් එකතුව රු.14,474,248 ක මූල්‍ය පාඩුවක් සිදුකර ඇති බව නිරීක්ෂණය කර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට සහ නීති, රීති හා මුදල් රෙගුලාසිවලට අනුකූල නොවී කටයුතු කරමින් මූල්‍ය පාඩුවක් සිදුකල නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන වාර්තා කරන ලෙස ප්‍රධාන ලේකම්ගේ අංක සීඑස්එස්/2/3/43 (i) දරන 2016 නොවැම්බර් 10 දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇතත් 2018 අප්‍රේල් 30 දින වන විටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන ජනාධිපතිතුමාගේ ලිපිය හා 2006 අප්‍රේල් 23 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියට අනුව පළාත් සභා අමාත්‍යවරයෙකුගේ සහාය කාර්ය මණ්ඩලය සඳහා වෙන් කරනු ලබන උපරිම නිල වාහන ගණන 03 ක් වුවත්, ඊට අමතරව අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය සතු සංචිත වාහන 02 ක් අමාත්‍ය කාර්ය මණ්ඩලයට වෙන් කරගෙන සමාලෝචිත වර්ෂයේදී රු.1,630,800 ක් වටිනා ඉන්ධන ලබාදී තිබුණි.

(ඈ) 2006 මාර්තු 18 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන ලිපිය මඟින් සංශෝධිත 2006 ජනවාරි 04 දිනැති සමාංක දරන ජනාධිපතිතුමාගේ ලිපියට අනුකූල නොවී සමාලෝචිත වර්ෂයේදී දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ විෂය භාර අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට නිලධාරීන් 06 දෙනෙකු වැඩිපුර අනුයුක්ත කර එකතුව රු.2,460,068 ක් වූ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

6.12 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | විස්තරය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව - ස්ථිර | තථ්‍ය සේවක සංඛ්‍යාව - අනියම්/ආදේශක/ කොන්ත්‍රාත් | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| i. | පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු | 6059 | 4889 | 63 | 1170 |
| ii. | පාසැල් කාර්ය මණ්ඩලය | 28062 | 25883 | 08 | 2179 |
| iii. | සෞඛ්‍ය කාර්ය මණ්ඩලය | 9058 | 7470 | 197 | 1588 |
| iv. | පළාත් පාලන ආයතන | 5775 | 5088 | 429 | 687 |
| v. | ප්‍රඥප්ති මගින් පිහිටවූ ආයතන | 595 | 502 | 06 | 93 |
| | | 49549 | 43832 | 703 | 5717 |

(අ) පළාත් සභා නිලධාරීන්ගෙන් 5717 ක් වූ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දකුණු පළාත් සභාව තුළ අනියම්/ ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු නිලධාරීන් 703 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය.

6.13 පාඩු හා හානි

(අ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් 2016 මැයි 13 දින අදාළ රියදුරු විසින් බීමත්ව සිය පෞද්ගලික ගමනක් සඳහා ධාවනය කිරීමේදී අනතුරට ලක්වීම හේතුවෙන් රු.280,500 ක හානියක් සිදු වීම නිසා අලාභය රියදුරු විසින් ගරාජයක් වෙත ගෙවා තිබුණි. 2016 ජුනි 02 දිනැති මූලික විනය පරීක්ෂණ වාර්තාව මඟින් අදාළ රියදුරු වැරදිකරු කර වැඩ තහනම් කිරීමට හා වැරදි සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට යෝජනා කර තිබුණි. එහෙත් ප්‍රධාන ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණ හා රියදුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් කරුණු පරීක්ෂා කර අදාළ රියදුරු පරිවාස කාලයට යටත්ව රියදුරු තනතුරේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර තිබුණි.

(ආ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් 2015 අගෝස්තු 07 දින අනතුරකට ලක් වීම නිසා රු.4,708,960 ක හානියක් සිදු වී තිබුණි. එහෙත්, රක්ෂණ සමාගම විසින් රු.3,834,000 ක හානි ප්‍රතිපූර්ණයක් කිරීමට එකඟ වී තිබුණු අතර ඉතිරි රු.874,960 ක මුදල අනතුරට වගකිවයුතු පාර්ශවයෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. 2017 සැප්තැම්බර් 26 දින නීතිපති දෙපාර්තමේන්තුව විසින්ද අනතුරට වගකිව යුතු තෙවන පාර්ශවයෙන් අලාභය අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද, අනතුර සිදු වී මාස 28 ක් ගතවී ඇතත් වාහනය යථා තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. එහෙත් එම කාලය තුළ වාහනය සඳහා මාසික කල්බදු වාරික හා වාර්ෂික රක්ෂණාවරණ ගාස්තු වැනි වියදම් දැරීමට සිදුව තිබුණි.

(ඇ) දකුණු පළාත් සභාවේ දෙපාර්තමේන්තු හා කාර්යාලවලට අයත් නොවිසඳී පවතින අවස්ථා 80 කට අදාළ රු.12,484,107 ක වාහන අනතුරු සම්බන්ධ හානි හා අවස්ථා 13 කට අදාළ රු.22,117,887 ක දේපල හානි ඇතුළුව මුළු හානිවල එකතුව රු.34,601,994 ක් විය.

## 07. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

---

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව දකුණු පළාත විසින් අදාළ අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම හා තම සංවර්ධන කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම 2018 ජුනි 20 දින වන විට සිදුකර තිබුණි. දකුණු පළාත සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අංශ 23 ක් හා උපමාන පාදක ප්‍රදාන අංශ 33 ක් යටතේ ව්‍යාපෘති සැලසුම් සකස් කර පළාත් අමාත්‍යාංශ 05 හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන මඟින් සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබයි. එහෙත් 2019 - 2021 යෝජිත තුන් අවුරුදු පළාත් සංවර්ධන සැලැස්ම සඳහාද තිරසර ඉලක්ක පාදක කර ගනිමින් කටයුතු කරන ලෙස දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය මඟින් සියලුම අමාත්‍යාංශ වෙත අවශ්‍ය උපදෙස් ලබාදී තිබූ නමුත්, එම තුන් අවුරුදු පළාත් සංවර්ධන සැලැස්ම 2018 ජුනි 20 දින දක්වා පිළියෙල කර නොතිබුණි.

## 08. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---

### 8.1 අභ්‍යන්තර විගණනය

---

පළාත් මූල්‍ය රීති 82.5.2 ප්‍රකාරව ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වාසනීයත්වය නිශ්චය කිරීම හා යොදාගෙන ඇති පිළිගත් ගිණුම්කරණ පිළිවෙත් මඟින් නිවැරදි මූල්‍ය ප්‍රකාශනයක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේදැයි සොයා බැලීම පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය වුවද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ලේකම් කාර්යාලය සහ පළාත් අරමුදල් ගිණුම සම්බන්ධයෙන් විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව ප්‍රධාන ලේකම් කාර්යාලය විගණනය සඳහා මිනිස් දින 30 ක් වෙන් කර තිබුණි.

## 8.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

බලපිටිය මූලික රෝහලේ සායනික අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු කටු පිළිස්සුම් යන්ත්‍රය 2013 ජූලි 07 දින සිට අළුත්වැඩියා කිරීමට නොහැකි ලෙස අක්‍රීය වී තිබුණි. සාමාන්‍යයෙන් දිනකට රෝහලේ සායනික අපද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 75 ක් පමණ එකතු වන අතර, සායනික අපද්‍රව්‍ය විවෘත පරිසරයේ පිළිස්සීම තුළින් රෝහල් කාර්ය මණ්ඩලය , රෝගීන් හා ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවයට පත්වීම සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

## 09. පද්ධති හා පාලන

විගණනයේදී හඳුනාගන්නා ලද අඩුපාඩු විගණන විමසුම් මගින් වරින් වර පළාත් සභාවේ ආයතන ප්‍රධානීන්ගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධතිය | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාලප්‍රමාදයන් පැවතුණි. |
| (ආ) ආදායම් පරිපාලනය | නිසි අධ්‍යයනයකින් සහ ඇගැයීමකින් යුතුව ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. |
| (ඇ) ගිණුම්කරණය | (i) පොදු තැන්පත් ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.<br>(ii) පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් ශේෂ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ගිණුම් හා පළාත් භාණ්ඩාගාර ගිණුම් අතර නොසැසදීම් දක්නට ලැබුණි. |